# සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය

# තනතුරු ඇබෑර්තු

සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති තනතුර සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2025.07.14 දින සිට 2025.07.28 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | කොමිෂන් සහා අනුමත දීමනා |
|---|---|---|---|---|
| කළමනාකරණ සහකාර | 104 : 9<br>III | 13 | 14974 - 23024/-<br>145x10-180x10-220x10-260x10 | ● මූලික වැටුපෙන් 15% අන්තර් දීමනාව.<br>● 08/2015 චක්‍ර ලේඛනය මගින් අනුමත රු. 2500/-<br>● 05/2022චක්‍රලේඛනය මගින් අනුමත රු. 5,000/- දීමනාව.<br>● 02/2024 චක්‍ර ලේඛනය මගින් අනුමත රු. 10,000/- දීමනාව. |
| කළමනාකරු ප්‍රාදේශික | 104 : 8<br>III | 06 | 15724 - 25524/-<br>180x10-220x10-260x10-320x10 | |
| අයකැමි | 104 : 9<br>III | 01 | 14974 - 23024/-<br>145x10-180x10-220x10-260x10 | |
| ඉන්ධන පුරවන්නා | 105 : 11<br>III | 15 | 14234 - 19984/-<br>120x10-130x10-145x10-180x10 | |
| කාර්යාල කාර්ය සහයක | 105 : 11<br>III | 02 | 14234 - 19984/-<br>120x10-130x10-145x10-180x10 | |
| ආරක්ෂක නියාමක | 105 : 10<br>III | 02 | 14504 - 21,254/-<br>130x10-145x10-180x10-220x10 | |
| රියදුරු | 105 : 10<br>III | 01 | 14504 - 21,254/-<br>130x10-145x10-180x10-220x10 | |

02. මෙම තනතුර ස්ථිරය. සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

## I. කළමනාකරණ සහකාර 104 :9

- **වයස අවුරුදු 18 – 45 අතර විය යුතුය.**

අ. 105 : 11 වැටුප් පරිමාණයේ අදාළ ස්ථිර තනතුරක වසර 8 ක් හෝ 105 : 10 වැටුප් පරිමාණයේ අදාළ ස්ථිර තනතුරක වසර 6 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ. ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයන් 6 කින් සමත්වීම හෝ සමුපකාර (සා.පෙ.) සමත්වීම. (ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම සහ පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට නොඅඩු පරිගණක පාඨමාලාවක් සමත්වී තිබීම විශේෂ සුදුසුකමක් වේ.)

## II. කළමනාකරු ප්‍රාදේශික - 104 : 8

- **වයස අවුරුදු 21 – 45 අතර විය යුතුය.**

අ. 104:9 වැ.ප. අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 02 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ 105:10 වැ.ප. අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

ආ. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, සිංහල ඇතුළු විෂයන් 06 ක් සමත්වීම.

හෝ

ඇ. ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ බැංකු හා මූල්‍ය සහතිකය සමග වසර 02 කට නොඅඩු බැංකු ක්ෂේත්‍රයේ සතුටු දායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## III. අයකැමි - 104 :9

- **වයස අවුරුදු 18 – 45 අතර වීය යුතුය.**

අ. 105 : 10 ක්ෂේත්‍රයට අදාළ ස්ථිර තනතුරක වසර 5 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ. ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් විෂයන් 6 කින් සමත්වීම සහ පිළිගත් ආයතනයක එක් වසරක අයකැමි තනතුරෙහි පළපුරුද්දක් ලබා තිබීම.

## IV. ඉන්ධන පුරවන්නා - 105:11

- **වයස අවුරුදු 18 -45 අතර විය යුතුය.**

අ. 8 වන ශ්‍රේණිය සමත් අධ්‍යාපන සහතිකය සමග පිළිගත් ආයතනයක ඉන්ධන පුරවන්නා තනතුරක මාස 6 කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## V. කාර්යාල කාර්ය සහයක - 105:11

- **වයස අවුරුදු 18 -45 අතර විය යුතුය.**

අ. 8 වන ශ්‍රේණිය සමත් වීම.

## VI. ආරක්ෂක නියාමක - 105:10

- **වයස අවුරුදු 18 -45 අතර විය යුතුය.**

අ. 8 වන ශ්‍රේණිය සමත් වීම සහ උස අඩි 5.6 ට නොඅඩු වීම, මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත වීම. (වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

## VII. රියදුරු- 105:10

- **වයස අවුරුදු 18 -45 අතර විය යුතුය.**

අ. අදාළ වලංගු රියදුරු බලපත්‍රය සමග 105:11 වැටුප් පරිමාණයේ ස්ථිර විය සහයක තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම, (බඳවා ගන්නා අවස්ථාවේ රිය පැදවීම පිළිබඳ ප්‍රවීනතා පරීක්ෂණයකින් සමත්විය යුතුය.)

හෝ

ආ. අටවෙනි ශ්‍රේණිය සමත්වීම සහ මෝටර් වාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වසරකට වඩා පැරණි වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම සහ වසරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. වයස් සීමාව – අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට, සමුපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

05. බඳවා ගැනීමේ ක්‍රමය – ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්,

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර, බඳවා ගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත හෝ ලබා දී ඇති පත්වීම අවලංගු කළ හැකිය.

07. වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයෙකු සෘජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිම හේතුවක් නිසාවත් සලකා බලනු නොලැබේ.

08. අයදුම්පත්‍රය යොමු කිරීම.

I. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතියේ ..................... තනතුර සඳහා බඳවා ගැනීම"** යන්න සඳහන් කළ යුතුය.

II. ඔබ විසින් සකසන ලද අයදුම්පත්‍රය 2025.07.28 වැනි දින ප.ව.3.00ට පෙර හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (අතින් ගෙනවිත් බාරදීමට හා විද්‍යුත් තැපැලට යොමු කිරීමටද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**සභාපති,**
**සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය,**
**562, ගාලු පාර, කොළඹ 3.**
careerscolombosouth@gmail.com
**0112502316**

**සභාපති**

**2025.07.14 දින දීය.**
**සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය.**